මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ

හා

අභ්‍යාස ආයතනය

වාර්ෂික වාර්තාව

2022

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා
අභ්‍යාස ආයතනය
“රුවන් සෙවන”
නො:73/5/A,
වැලිවිට
2023.02.28

ගරු අමාත්‍යතුමා
කර්මාන්ත අමාත්‍යාංශය
තැ.පෙ 570,
73/1
ගාලු පාර,
කොළඹ-03

ගරු අමාත්‍යතුමනි,

වාර්ෂික වාර්තාව 2022

1971 අංක (2) 14 38 උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ලේඛන ඔබ වෙත ඉදිරිපත් කරමි.

1. 2022 වර්ෂය සඳහා වූ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ පාලන වාර්තා
2. 2022 දෙසැම්බර් 31 දිනට කාර්ය සාධන වාර්තාව.

මෙයට විශ්වාසී

ඒ.එම්. රත්නායක
සභාපති
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

දැක්ම මෙහෙවර හා අභිමතාර්ථ

දැක්ම

“ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධිය හා සංවර්ධනය සඳහා අදාල පර්යේෂණ හා පුහුණු කටයුතු කරමින් කලාපයේ විශිෂ්ඨතම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වීම”

මෙහෙවර

“ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ඉතා තරඟකාරී මට්ටමේ කුසලතාවයන් වැඩි දියුණු කිරීම තුලින් අප සේවා දායකයන්ට උපරිම අන්දමේ සේවාවක් ලබා දීමට අදාල නව මැණික් තැන්පතු හඳුනා ගැනීම සඳහා ගවේෂණ කටයුතු මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධියට අදාල නව නිපැයුම් බිහි කිරීම හා ඒවායේ අගය වැඩි කිරීමට අදාල ශිල්පීය හා තාක්ෂණික දැනුම හා කුසලතා වලින් පිරිපුන් ශ්‍රමිකයන් බිහි කිරීම මෙන්ම කර්මාන්තයට අදාල වැඩමුළු සඟරා පොත්පත් හා පර්යේෂණ ග්‍රන්ථ පල කිරීම අපගේ මෙහෙවරයි ”

අභිමතාර්ථ

“ ශ්‍රී ලංකාවේ මැණික් බනිජ සම්පත් විභව ප්‍රදේශ ගවේෂණය කර තිරසාර ලෙස නෙලා ගැනීම සහ නව තාක්ෂණික ක්‍රම පිළිබඳ පුහුණුවක් සහිත ශ්‍රමිකයන් තුලින් ජාතික ආර්ථිකයට දායක වීම”

2.1. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

2022 වර්ෂය තුල ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංයුතිය පහත සඳහන් පරිදි විය.

01	ඒ.එම්. රත්නායක මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සභාපති 2022.06.27 දින සිට මේ දක්වා
02	මහාචාර්ය පී.ජී.ආර්.ධර්මරත්න මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සභාපති 2021.12.27 දින සිට 2022.06.26 දින දක්වා
03	පී.යූ.කේ. තේනුවර මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2022.01.31 දින සිට 2022.12.31 දින දක්වා
04	ආර්.එම්.ඩී.කේ.ජී.එන්.බී.රණතුංග මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2021.10.14 සිට 2022.03.31 දින දක්වා
05	කේ.එන්.පී. ජයරත්න මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2022.04.01 සිට මේ දක්වා
06	වෛද්‍ය සෙනරත් හේවගේ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2022.03.08 සිට 2022.12.31 දක්වා
07	ප්‍රභා මලලසේකර මහත්මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2020.01.22 සිට 2022.12.08 දින දක්වා
08	එස්.ජී.එල්. ප්‍රනාන්දු මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2022.12.08 සිට මේ දක්වා
09	එස්.ඒ.ඩබ්.කේ. ජයසේකර මහතා	අධ්‍යක්ෂ මණ්ඩල නිරීක්ෂක (අමාත්‍යාංශ නියෝජිත) 2022.01.31 සිට මේ දක්වා

ඉහළ කළමණාකාරීත්වය



ඒ.එම්. රත්නායක මහතා

සභාපති

(2022.06.27 දින සිට)



මහාචාර්ය පී.ජී.ආර්.ධර්මරත්න

සභාපති

(01.01.2022 දින සිට 26.06.2022 දක්වා)
BASc (SL),MSc (Newcastle),
Ph.D(Leeds),FIE,FGG,FGA,C.Eng



බී.ජී.ආර්.ඩබ්. ගම්ලත් මහතා

අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

MSC (Gem),B.Sc (SP) (Physics) FGA,
MGA (SL),MBA(Reading)



බී.ජී.ආර්.ඩබ්. ගම්ලත් මහතා

අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන)

MSC (Gem),B.Sc (SP) (Physics) FGA,
MGA (SL),MBA(Reading)



ආර්.එම්.එන්.පී.කේ ජයසිංහ මහතා

අධ්‍යක්ෂ(ජර්යේෂණ) වැ.බ

M.Phil(Gem.),M.Sc(GIS & RS),B.Sc.
(Geology),MIGSL,MGSSL,MGASL



එස්.එල්.ජේ. මුහන්දිරම් මහතා

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)

MPAcc(USJP),B.com (SP)Accountancy 2nd
lower Hons (USJP),CBA(ICASL),ADV.Cer
(Procurment)(ICTAD



ඩබ්.එල්. ප්‍රසංගිකා සුරේන්ද්‍ර මිය

සහකාර අධ්‍යක්ෂ
(පරිපාලන හා මානව සම්පත්)

B.des,Jew(Sp)(UOM)

ක්ෂේත්‍රය සඳහා සේවා සපයන්නන් විසින් සම්පූර්ණ නොකරන ලද අවශ්‍යතා තවමත් ඇත .මේ යටතේ ක්‍රමවත් මැණික් නිධි ගවේශණ ,ප්‍රාථමික මැණික් නිධි හඳුනාගැනීම ,නිධි ලබා ගැනීමේ තාක්ෂණය ඉහළනැංවීම සහ සමස්ථයක් ලෙස ප්‍රමාණාත්මකව නවීන තාක්ෂණය කර්මාන්තයට සම්ප්‍රේෂණය වීම මන්දගාමී තත්වයක් ඇත.

- **තාක්ෂණික අභිවර්ධනය**

  මැණික් නිධි කැණීම සහ මැණික් වල වර්ණය වැඩි දියුණු කිරීම වැනි කටයුතු සඳහා නව යන්ත්‍රෝපකරණ සොයා ගැනීම සහ හඳුන්වාදීම සඳහා ද ඉඩ ප්‍රස්ථාවක් ඇත .

- **ආයතනයේ දියුණුව**

  ලෝකයේ විවිධ ප්‍රදේශ වල සේවා ලාභීන් සඳහා සේවය ලබා දීමට ආසියානු පැසිපික් කලාපයේ මැණික් හා ස්වර්ණාභරණ පිළිබඳ උපාධි පාඨමාලාවන් පිරිනැමීමට හැකි පරිදි මෙම ආයතනය උසස් කිරීමේ අවශ්‍යතාවය ද ඇත.

- **වෙනත් පහසුකම්**

  ගෙවුඩ තාප පිරියම් කිරීමේ මධ්‍යස්ථාන ශ්‍රී ලංකාවේ වෙනත් ස්ථාන වල ස්ථාන ගත කිරීම සහ පර්යේෂණ පහසුකම් මහින්ද මෙම ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල සේවාවන් ලබා දීම සඳහා අවස්ථාවන් ඇත.

- **කර්මාන්තයේ දියුණුව සඳහා සංධීය වැඩසටහන්**

  මධ්‍යම පරිසර අධිකාරිය සමග මැණික් කර්මාන්තය සඳහා පරිසර හිතකාමී ක්‍රම සඳහා අනුබල දීමද , ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග පර්යේෂණ ව්‍යාපෘති සඳහා ද ,වෙනත් රාජ්‍ය ආයතන සමග විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා ද සහසම්බන්ධ වෙමින් කටයුතු කිරීමේ අවස්ථාවන් ඇත .

- **ප්‍රචාරක වැඩසටහන්**

  ආයතනයේ සේවාවන් පිළිබඳ මහජනතාව වෙත ප්‍රචාරණය කිරීමේ වැඩසටහන් දියත් කිරීමේ හැකියාව ඇත. මේ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ,මැණික් හා ස්වර්ණාභරණ සඟරා, පත්‍රිකා සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් ආදිය සඳහා අවස්ථාවන් ඇත.

3.2. අභියෝග

- **යටිතල පහසුකම්**

  නවීන උපාංග හා යන්ත්‍රෝපකරණ පුහුණු ඒකක වලට හඳුන්වා දී ඒ හරහා කර්මාන්තයෙහි ප්‍රගමනයට අවශ්‍ය පුහුණුව, දැනුම හා කුසලතාවය ලබා දීමට කඩිනම් පියවර ගත යුතුව ඇත. ස්වර්ණාභරණ පුහුණු ඒකක වල මැණික් කැපීමේ ඒකකය හා මැණික් රසායනාගාරය සඳහා ඉතා දියුණු යන්ත්‍ර උපකරණ හඳුන්වා දිය යුතු වේ .තවද ලෝහ ප්‍රමිතිය නිශ්චය කිරීමේ ඒකකයක් ආරම්භ කර ඒ ආශ්‍රිත පාඨමාලා හඳුන්වා දිය යුතුව ඇත .දියමන්ති කැපීම මෙම කර්මාන්තයේ සුවිශේෂී කර්මාන්තයක් වන බැවින් ඒ සඳහා අදාල පුහුණු ඒකකයක් ස්ථාපනය කර දැනුම ලබා දීම හා ඒ ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා පියවර ගත යුතුවේ .

- **භෞතික සම්පත්**

  ආයතනයේ පර්යේෂණ හා පුහුණු අංශයේ වැඩකටයුතු ප්‍රසාරණාත්මක මට්ටමකින් කරගෙන යාමට අවශ්‍ය වාහන ඌනතාවයක් දක්නට ඇත. තවද වර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි පර්යේෂණාගාර පහසුකම්ද වැඩි දියුණු කිරීමට අවශ්‍යව ඇත.

- **සේවකයන්ගේ දුර්වල ආකල්ප**

  මෑත අතීතයේ සේවකයින් තුල ඍණාත්මක ආකල්පමය මානසික පසු බිමක සිටීම.

- **සහෝදර ආයතන මඟින් අපගේ සේවාවන් ද්විකරණය.**

  උදාහරණ:- අපගේ පුහුණු කටයුතු, රසායනාගාර සේවා ආදිය.

- **මානව සම්පත්**

  කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත සේවක සැලැස්ම අනුව අප ආයතනය සඳහා සේවක සංඛ්‍යාව 136 ක් වන අතර වර්තමානයේ සේවයේ යෙදී සිටින සංඛ්‍යාව 65 ක් වේ. ආයතනයේ පර්යේෂණ හා පුහුණු කාර්ය මණ්ඩලය සඳහා දේශීයව තිබෙන පුහුණු අවස්ථාවන් සීමාසහිත වීම නිසා සහ මෙම ක්ෂේත්‍රයේ විෂය දැනුම සහිතව සිටින නිළධාරීන් සීමිත වීම නිසා පුහුණු අවස්ථාවන් සඳහා යොමු කිරීමට ඇති අවස්ථාවන් අවම වීම නිසා අප කාර්ය මණ්ඩලය වර්තමාන කර්මාන්තයේ ඉල්ලුම සැපිරීමට ප්‍රමාණවත් නොවන බව පෙනීයයි .එය කර්මාන්තයේ අනාගතයට හිතකර නොවන අතරම ආයතනයේ පුහුණු ඉල්ලුම පහලයාමට බලපෑ හැකිය .ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා හැකිතාත් දේශීය හා විදේශීය පුහුණු අවස්ථාවන් ලබා දීමෙන් මෙම තත්වය සඳහා විසඳුම් ලබා ගත හැකි වේ.

- **මූල්‍ය සම්පත්**

  වර්තමාන අවස්ථාවලට අනුව ආයතනයේ වැඩ කටයුතු ප්‍රසාරණාත්මක මට්ටමකින් කරගෙන යාමට ප්‍රමාණවත් අරමුදල් සඳහා මහාභාණ්ඩාගාර දායකත්වය අවම මට්ටමක පවතින අතර ඒ වෙනුවෙන් සුදුසු සෙස් බදු ක්‍රමවේදයක් ද මේ වන විට සැකසී නොමැත.

- **පෞද්ගලික අංශයේ පුහුණු ආයතන බිහි වීම**

  මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ අධ්‍යාපන කටයුතු සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම ක්‍රමයෙන් වර්ධනය වී ඇත.

- **කර්මාන්තයේ සමහර අංශ වල දිරිගැන්වීම් නොතිබීම**

  උදාහරණ -සේවා කැපුම් අංශය

4. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

4.1. අරමුණු

1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පාර්ලිමේන්තු පනතේ 25(1) වගන්තිය ප්‍රකාරව1995 ජූලි 28 දිනැති හා අංක 882 දරණ ගැසට් නිවේදනය මගින් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිටුවන ලදී.ආයතනයේ ප්‍රධාන අරමුණ වන්නේ පර්යේෂණ සහ පුහුණු පහසුකම් හරහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය විධිමත් කිරීම, වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීමයි.

4.2. ආයතනයේ බලතල

ශ්‍රී ලංකාවේ මැණික් බණිජ හා එම නිධි පිළිබඳව සමීක්ෂණය කිරීම හා ඊට අදාල පහත සඳහන් කරුණු ගැන විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.

1. ශ්‍රී ලංකාවේ මැණික් ඛනිජ පිළිබඳ සමීක්ෂණයන් කිරීම

(අ) පිහිටීම.
(ආ) හඳුනා ගැනීම.
(ඇ) මැණික් ගල් අනර්ගීකරණය කිරීමේ ක්‍රම.
(ඈ) වෙනත් අදාල ක්ෂේත්‍රයන් හා අදාල රත්න විද්‍යාත්මක පර්යේෂණ කිරීම් .

2. පතල් කැණීම, මැණික් කැපීම, ස්වර්ණාභරණ සෑදීම, මැණික් ගල් පිළිස්සීම සඳහා ක්‍රම සහ ස්වර්ණාභරණ තැනීම වැනි ක්ෂේත්‍රයන්හි මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුලත් ශිල්පීය සහ අනෙකුත් උපදෙස් සැපයීම.

3. (අ) මැණික් කැපීම.
(ආ) ස්වරණාභරණ සෑදීම.
(ඇ) දියමන්ති ඇතුලු රත්න විද්‍යාව.
(ඈ) ස්වර්ණාභරණ මෝස්තර සකස් කිරීම.
(ඉ) මැණික් ගල් අනර්ගීකරණය
(ඊ) මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ වෙනත් අදාළ අංශ පිළිබඳව පුහුණුවක් ලබා දීම.

4. වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම හා අදාල මාතෘකා හා කරන ලද වැඩ කටයුතු ආදිය පිළිබඳ පත්‍රිකා හා පොත්පත් පල කිරීම.

5. ආයතනයේ කර්තව්‍යයන් නිසි ලෙස ඉටු කිරීම පහසු කිරීමට අවශ්‍ය වෙනත් දෑ කිරීම.





පුහුණු අංශය







5.පුහුණු අංශය

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය තුළින් උත්පාදනය කරනු ලබන දේශීය හා විදේශීය ආදායම් ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය දැනුම හා කුසලතාවය ලබා දීම අරමුණු කර ගනිමින් ඒ ඔස්සේ පතල් කැණීමේ සිට ජාත්‍යන්තර වෙළඳපොළට නිෂ්පාදන හඳුන්වා දීම දක්වා වූ පුහුණු හා සංවර්ධන වැඩසටහන් මෙහෙයවීම පුහුණු අංශයේ ප්‍රමුඛ පරමාර්ථය වේ.


2022 වර්ෂයේ පුහුණු අංශ පාඨමාලා හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

5.1.වෘත්තිය අධ්‍යාපනය ඉලක්ක කර ගත් පුහුණු පාඨමාලා මෙහෙයවීමට කටයුතු කිරීම.

පතල් කැණීම් තාක්ෂණයේ සිට මෙම කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ ක්‍රමවේදයන් ඇතුලත් මහා පරිමාණ නිෂ්පාදන ජාත්‍යන්තරයට හඳුන්වා දීම දක්වා වූ විෂයය පථය ආවරණය වන ලෙස පුහුණු අංශය විසින් වෘත්තායාභිමුඛ හා රැකියාභිමුඛ පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කර ඇත. ආයතනික සහතික පත්‍ර මට්ටම , ජාතික වෘත්තිය සුදුසුකම් ප්‍රමිති මට්ටමට අදාල NVQ 3 – 4 මට්ටම් සහ ඩිප්ලෝමා මට්ටමට NVQ 5 අදාල වූ පාඨමාලා මේ යටතේ ආයතනය විසින් ක්‍රියාත්මක කිරීමට 2022 වර්ෂයේදීද කටයුතු කරන ලදි.


පසුගිය වසර වසර තුනක කාලයක් පුරා ගෝලීය වශයෙන් මුහුණ දීමට සිදු වූ විවිද තර්ජන හේතුවෙන් මෙන්ම දේශීය වශයෙන් ද ඇති වූ විවිද සමාජ ආර්ථික ප්‍රශ්න හමුවේ ඉතා අසිරුතාවයෙන් යුතුව ආයතනය විසින් පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කරගෙන යාමට කටයුතු කල අතර 2022 වසරේ දිද පුහුණු අංශයට පෙර වසර තුලදි ආරම්භ කරන ලද බහුතර පාඨමාලා ප්‍රමාණයක් මෙහෙයවීමට සිදු විය. ඒ හේතුවෙන්ම පෙර වසර වලට සාපේක්ෂව 2022 වසරේ දි පුහුණු කිරීමට අපේක්ෂා කල ශිෂ්‍ය සංඛ්‍යාව වුයේ 550 කි. නමුත් පුහුණු අංශය මානව සම්පත වඩාත් කාර්යක්ෂමව මෙහෙයවීමට හැකියාව ලැබූ බැවින් ඒ හරහා 2022 වසරේදි අපේක්ෂිත තත්ත්වය ඉක්මවා සිසුන් 826 ක් පුහුණු කිරීමට අංශයට හැකියාව ලැබී ඇත. ඒ අනුව 2022 වසරේදි පුහුණු අංශය විසින් පාඨමාලා ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනයට උත්පාදනය කර දි ඇති මුළු ආදායම රුපියල් මිලියන 16.3 ක් වේ.

5.1.1 2017 වසරේ සිට 2022 දක්වා පුහුණු පාඨමාලා සඳහා ශිෂ්‍ය බඳවා ගැනීමේ ප්‍රගතිය



වර්ෂය	ශිෂ්‍ය බඳවා ගැනීමේ ප්‍රගතිය	පාඨමාලා නිමකල ශිෂ්‍ය සංඛ්‍යාව
2017	1200	768
2018	1220	782
2019	1165	665
2020	465	194
2021	286	137
2022	846	217

5.1.2 2017 වසරේ සිට 2022 දක්වා පුහුණු පාඨමාලා මෙහෙයවීම තුළින් උපයන ලද ආදායම් වර්ධන ප්‍රගතිය




වර්ෂය	ආදායම රු මි
2017	8.78
2018	11.55
2019	13.17
2020	12.82
2021	3.74
2022	16.3

5.2 කර්මාන්ත ආශ්‍රිත පුහුණු දැනුම දිපව්‍යාප්ත කිරීම සඳහා මධ්‍යස්ථාන සැළසුම්කරණය

වර්තමානයේ වෘත්තිය පුහුණු අධ්‍යාපනය කෙරෙහි තරුණ ප්‍රජාව තුල වැඩි නැඹුරුතාවයක් පවතින ක්ෂේත්‍රයක් ලෙස වෘත්තිය පුහුණු අධ්‍යාපන ක්ෂේත්‍රය හැඳින්විය හැකිය. ඒ අනුව මෙම තත්ත්වය මැනවින් හදුනා ගනිමින් දේශීය ආර්ථික වර්ධනයට කර්මාන්ත අංශයෙන් වන දායකත්වය ඉහල නැංවීම උදෙසා වඩාත් ප්‍රමුඛ කර්මාන්ත ක්ෂේත්‍රයක් වන මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ආශ්‍රිත රැකියා ක්ෂේත්‍ර වර්ධනය කිරීම අරඹයා දිවයින පුරාම විසිරි සිටින පිරිස ඉලක්ක කර ගනිමින් 2022 වසරේදි පාඨමාලා මෙහෙයවීමට කටයුතු කර ඇත.

ඒ යටතේ කඩුවෙල ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් රත්නපුර, මහනුවර, ගාල්ල, යාපනය, අත්තනගල්ල, මඩකලපුව, නාඋල, සේනපුර, රත්නපුර තරුණ සේවා සභාව යන නව මධ්‍යස්ථාන 10 ක් 2022 වසරේදි සාර්ථකව පවත්වා ගෙන යාමට අංශය කටයුතු කර ඇත ආයතනයේ මේ වන විට පවතින ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන පහත සඳහන් පරිදි වේ.



01. කොළඹ 02. රත්නපුර 03. මහනුවර
04. ගාල්ල 05. යාපනය 06. මඩකලපුව
07. නාඋල 08. අත්තනගල්ල 09. සේනපුර
10. රත්නපුර තරුණ සේවා සභාව

❖ **සේනපුර වෘත්තිය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානයෙහි නව පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම.**

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යංශයේ ඉල්ලීමක් මත මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වී වැලිකන්ද සේනපුර වෘත්තිය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානයේ පුනරුත්ථාපනය වන තරුණයින් සඳහා මැණික් කැපීමේ වෘත්තිය පුහුණුව ලබා දීමට අදාලව ආයතනයේ මැණික් කැපුම් පුහුණු ඒකකයක් සේනපුර වෘත්තිය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයෙහි ආරම්භ කිරීමට 2022 වසරේදි හැකියාව ලැබිණි.

❖ **රත්නපුර තරුණ සේවා සභාව තුල මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.**

වෘත්තිය පුහුණු ආයතනයන් සියල්ල සමග අත්වැල් බැඳ ගනිමින් රට තුල විසිරි පවතින සියළු මානව හා භෞතික සම්පත් උපයෝගි කර ගනිමින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට ප්‍රමාණවත් නිපුණ තාක්ෂණික ශිල්පින් බිහි කිරීම සඳහා කටයුතු කිරීමේ ආයතනික සංකල්පය අනුව රත්නපුර තරුණ සේවා සභාව සමග එකඟතාවයකට පැමිණ එම මධ්‍යස්ථාන පරිශ්‍රයෙහි ආයතනයේ පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට හැකියාව 2022 වසරේදි ලැබී ඇත.

5.3 මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාලව ක්‍රියාත්මක කරන ලද පුහුණු පාඨමාලා

පසුගිය වසරක තුනකට ආසන්න කාලයක් පුරා ගෝලිය හා දේශීය වශයෙන් ඇතිවූ විවිධ සාමාජීය ආර්ථික දේශපාලනමය ගැටළු සහගත තත්ත්වයන්ට ආයතනයටද පොදුවේ මුහුණ දීමට සිදුවීම නිසා පසුගාමී තත්ත්වයට පත්වූ ආයතනයේ පාඨමාලා සංවර්ධන කටයුතු සඳහා නැවත අවතීර්ණ වීමට අංශය මෙම වසරේදි වැඩි අවධානයක් යොමු කරන ලදි. ඒ අනුව කර්මාන්තය ආශ්‍රිතව නිරන්තරව වෙනස් වීමට ලක්වන ක්ෂේත්‍ර සඳහා සහ රැකියා අවස්ථා බහුලව පවතින ක්ෂේත්‍ර සඳහා වන වැඩි නැඹුරුතාවයක් ලබා දීමට හැකිවන අයුරින් පුහුණු පාඨමාලා මෙහෙයවීම කෙරෙහි වැඩි අවධානයක් මෙම වසරේද යොමු කර ලද අතර ඒ අයුරින් කටයුතු කරනු ලැබිණි.ඒ අනුව පුහුණු අංශය සතු මානව හා භෞතික සම්පත් උපරිම හා ප්‍රශස්ථ ආකාර කළමණාකරණය කරමින් නූතන තරුණ පරපුරද වැඩි ආකර්ශණයක් යොමු කරනු ලබන තාක්ෂණයට අනුගත වෙමින් පහත සඳහන් පාඨමාලා 2022 වසරේදි ක්‍රියාත්මක කිරීමට ආයතනයට හැකියාව ලැබිණි.

5.3.1 මැණික් ක්ෂේත්‍රය ආශ්‍රිතව ක්‍රියාත්මක කරනු ලැබූ පුහුණු පාඨමාලා

- මූලික රත්න විද්‍යාව
- රත්න විද්‍යාව
- දෙමුහුන් රත්න විද්‍යාව Blended Gemmology
- ගෙවුඩතාප පිරියම් කිරීම
- මැණික් වර්ණ ශ්‍රේණිගත කිරීම හා අළෙවිකරණය
- මැණික් කැපීම සහ ඔප දැමීම NVQ 3 / 4
- මැණික් කැපීම කෙටි කාලීන පාඨමාලා
- මැණික් කැටයම් කැපීම සහ පබළු ආභරණ නිෂ්පාදනය

5.3.2 ස්වර්ණාභරණ ක්ෂේත්‍රය ආශ්‍රිතව ක්‍රියාත්මක කරනු ලැබූ පුහුණු පාඨමාලා

- ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය
- පරිසනක ආශ්‍රිත ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය
- විලාසිතා ආභරණ නිෂ්පාදනය
- ස්වර්ණාභරණ නිෂ්පාදනය NVQ 3 / 4
- ආභරණ සඳහා ගල් බැඳීම NVQ 3

පුහුණු පාඨමාලාව	මහනුවර	රත්නපුර	රැලපනාව	මාලිගාව	මාලිගාවපුර	ලුසිටෝරම	මාලිය	රත්නපුර	කෑගල්ලපුර රත්නපුර	පාඨමාලාව හදාරන ලද සිසුන් ගණන
රත්න විද්‍යා ඩිප්ලෝමාව	-	13	-	-	-	-	-	-	-	13
මූලික රත්න විද්‍යාව	81	64	-	-	-	-	-	-	-	145
දෙමුහුන් රත්න විද්‍යාව	22	-	-	-	-	-	-	-	-	22
රත්න විද්‍යාව	83	56	-	-	-	-	-	-	-	139
කෙටි කාලීන රත්න විද්‍යාව	02	9	-	-	-	-	-	-	-	11
ගෙවුඩතාප පිරියම් කිරීම	16	86	-	-	-	-	-	-	-	102
මැණික් වර්ණශ්‍රේණිගත කිරීම හා අලෙවිකරණය	-	24	-	-	-	-	-	-	-	24
මැණික් කැපුම් දින 10 පාඨමාලාව	05	11	-	-	-	-	3	-	-	19
මැණික් කැපීම සහ ඔප දැමීම	30	88	46	-	-	-	17	29	11	221
මැණික් කැටයම් කැපීම	-	7	-	-	-	-	-	-	-	7
ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය	21	17	20	11	-	-	-	-	-	69
පරිඝණක ආශ්‍රිත ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය	17	-	-	-	-	-	-	-	-	17
විශේෂ පරිඝණක ආශ්‍රිත ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය කෙටි කාලීන	01	-	-	-	-	-	-	-	-	01
විලාසිතා ආභරණ නිෂ්පාදනය	-	15	-	-	-	-	-	-	-	15
ස්වර්ණාභරණ නිෂ්පාදනය	03	-	-	-	12	8	-	-	-	23
කෙටි කාලීන ස්වර්ණාභරණ නිෂ්පාදනය	03	-	-	-	-	-	-	-	-	3
ස්වර්ණාභරණ සඳහා ගල් බැඳීම	16	14	-	-	-	-	-	-	-	30
මුළු එකතුව	**300**	**404**	**66**	**11**	**12**	**8**	**20**	**29**	**11**	**861**

5.4 මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ආශ්‍රිත අනිකුත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

5.4.1 නිරවද්‍යතාවයෙන් (precision Cutting) යුතු මැණික් කැපීමේ රටාවන් ගොඩනැගීමේ නව පුහුණු ඒකකයක් ස්ථාපිත කිරීමට සැළසුම් කිරීම.

දේශීය වශයෙන් කුඩා ප්‍රමාණයේ මැණික් ගල් සුලභ වශයෙන් හමු වුවත් ඉතා ඉහල නිවැරදිතාවයකින් (±0.002) යුතුව විද්‍යානුකූලව එම මැණික් කපා ඔප දැමීමේ තාක්ෂණය කර්මාන්තය තුල ව්‍යාප්තව නොමැති බැවින් විද්‍යානුකූලව නිවැරදිතාවයකින් යුක්තව මෙවැනි මැණික් කපා ඔප දැමීමේ තාක්ෂණය කර්මාන්තයට හා එහි නියුක්තවන්නන්ට හඳුන්වාදීම සඳහා නව පුහුණු පාඨමාලා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කර ඇත. ඉහත ව්‍යාපෘති රට තුල දැනට භාවිතයට නොගන්නා හා අගය එකතු කිරීමට ලක් නොවන කුඩා ප්‍රමාණයේ මැණික් විශාල වශයෙන් නිෂ්පාදනය සඳහා පසුබිම නිර්මාණය වේ. මේ හරහා විශාල රැකියා ප්‍රමාණයක් ප්‍රාදේශීයව හා ගෘහාශ්‍රිතව

නිර්මාණයවේ. ඒ අනුව සෘජු හා වක්‍ර ලෙස ප්‍රතිලාභ රාශියක් ආර්ථික වශයෙන් ලගා කර ගැනීමට අවකාශය ඇති වේ.

5.4.2 පුහුණු පාඨමාලා සඳහා ජාතික වෘත්තිය සුදුසුකම් ප්‍රතීතන මට්ටම් සකස් කර ගැනිමට කටයුතු කිරීම

මැණික් හා ස්වර්ණාභරණ විෂයය ක්ෂේත්‍රයට අදාලව පහත සඳහන් වන පුහුණු පාඨමාලා සඳහා අවශ්‍ය ජාතික වෘත්තිය නිපුණතා ප්‍රමිති මට්ටම් (NVQ) සකස් කර ගැනිම සඳහා අවශ්‍ය කටයුතු වෙනුවෙන් තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාව වෙත අවශ්‍ය ලේඛණ යොමු කර ඇති අතර මේ වන විට ජාතික ආධුනිකත්ව සහ පුහුණු කිරීමේ අධිකාරිය විසින් මෙම පාඨමාලා සඳහා අවශ්‍ය නිපුණතා සම්මත නිකුත් කිරීමට අදාල ක්ෂේත්‍ර කටයුතු සිදු කරනු ලබයි.

- ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය - NVQ 4
- මැණික් හඳුනා ගැනිම - NVQ 4
- රත්න විද්‍යාව - NVQ 5
- මැණික් කැපීම සහ ඔප දැමීම - NVQ 5

මෙම පුහුණු පාඨමාලා සඳහා අදාල නිපුණතා සම්මත සකස් කර ගැනිමේ කටයුතු සඳහා වෘත්තිය තාක්ෂණ විශ්ව විද්‍යාලය සමග අනුබද්ධව පාඨමාලා මෙහෙයවීමට අදාල කටයුතු සිදු කරනු ඇත.

ව්‍යාපාර කළමනාකරණ විෂයයන් පිළිබඳ මොඩියුලයක් ඇතුළත් කිරීම සඳහා මැණික් කැපීම, මැණික් විද්‍යාව සහ ස්වර්ණාභරණ නිෂ්පාදන විෂය මාලාව සමාලෝචනය කිරීමට කටයුතු 2022 වසරේදි ආරම්භ කර ඇත.

5.4.3 තත්ත්ව කළමණාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.



ගුණාත්මක පුහුණු හා අධ්‍යාපන පද්ධතියක් පවත්වා ගෙන යාම සඳහා ජාත්‍යන්තර ප්‍රමිති තත්ත්වයන්ට අනුකූලව ISO 9002 අනුකූලව ආයතනය තුල තත්ත්ව කළමණාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු පෙර වසරයන් තුලදි සිදු කරන ලද අතර ඒ අනුව ආයතනය තුල එම ප්‍රමිතියන්ට අනුකූලව පුහුණු අංශයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම 2022 වසරේ දි සිදු කරන ලදි.

5.4.4 සහතිකපත් ප්‍රදානෝත්සවයක් පැවැත්වීම.



වෘත්තිය රත්න විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සහ ජාතික වෘත්තිය සුදුසුකම් ප්‍රතීතන මට්ටම 4 යටතේ පුහුණු පාඨමාලා හදාරන ලද පුහුණු ලාභීන් 150 ක් සඳහා ආයතනය තුල ප්‍රථම වරට උසස් අන්දමින් සහතික පත්‍ර ප්‍රදානෝත්සවයක් 2022 වසරේ සාර්ථකව පවත්වන ලදි.

5.4.5 පාඨමාලා ප්‍රචාරණ සහ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.

2022 වසර කේන්ද්‍ර කර ගෙන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු පාඨමාලා සඳහා පුහුණු ලාභීන් හඳුනා ගැනීම සඳහා පාඨමාලා ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරනු ලැබිණි. මේ යටතේ ස්වාධීන රූපවාහිනී සේවයේ ''දොරමඩලාව '' සංවාදාත්මක සාකච්ඡාමය ඩසටහන සඳහා සහභාගි වීමට කටයුතු කරන ලදි. මෙයට අමතරව කේෂ්ත්‍රය පිළිබඳ බාහිර ප්‍රජාවගේ දැනුවත් භාවය වැඩි කිරීම සඳහා වැඩසටහන්

සැළසුම් කිරීම හා පළාත් ප්‍රවර්ධන, ප්‍රචාරණ ව්‍යාපාර සහ සමාජ මාධ්‍ය පදනම් කරගත් ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇත.

5.4.6 මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ තිරසාර පැවැත්ම සඳහා තාක්ෂණික වැඩමුළු පැවැත්වීම.




සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් හට නූතන තාක්ෂණික දැනුම ලබා දීම සඳහා කර්මාන්තය ආශ්‍රිත තාක්ෂණික වැඩමුළු ගම්පහ , කෑගල්ල , මාතලේ යන ප්‍රදේශ කේන්ද්‍ර කර ගෙන පවත්වන ලදි.


මැණික් කැටයම් කැපීම හා විලාසිතා ආභරණ නිශ්පාදන විවිධාංගීකරණ ව්‍යාපෘතිය යටතේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සම්පත් දායකත්වයෙන් ව්‍යාපෘති සාමාජිකයන් හා ආදි සිසු කර්මාන්ත කරුවන් සඳහා රත්නපුර මධ්‍යස්ථානයේ ණය යෝජනා ක්‍රම සහ මූල්‍ය කලමණාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2022 වසරේදී පැවැත්වීමට හැකි විය. එසේම ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සමග ඒකාබද්ධතාවයෙන් යුතුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණික විද්‍යා උපාධි අපේක්ෂයින් වෙනුවෙන් මැණික් කැපුම් පුහුණු වැඩමුළුවක් පවත්වන ලදි.

5.4.7 පුහුණු පාඨමාලා අධ්‍යයන ස්වයං ආධාරක වශයෙන් කෘති මුද්‍රණය


- රත්න විද්‍යාව
- ගෙවුඩතාප පිරියම් කිරීම
- මැණික් කැපීම සහ ඔප දැමීම
- ස්වර්ණාභරණ නිෂ්පාදනය

පුහුණු පාඨමාලා සඳහා වැඩිදුර උසස් දැනුමක් ලබා ගැනීමට හැකි ආකාරයෙන් මුද්‍රිත පුළුල් විස්තර සහ තොරතුරු ඇතුලත් පොත් මුද්‍රණය කිරීමටත් මෙම පොත් පුහුණු ලාභීන් වෙත යම් සහනදායී මුදලක් ලබා දී අලෙවිකිරීමටත් 2022 වසරේදී කටයුතු කර ඇති අතර මෙම කෘති සඳහා පුහුණු ලාභීන්ගේ විශාල කැමැත්තක් සහ ඉල්ලුමක් පවතින බව හඳුනා ගෙන ඇත.








පර්යේෂණ අංශය
LEIC
5x

6. 2022 පර්යේෂණ වැඩසටහන්වල ප්‍රගතිය

6.1 ව්‍යාපෘතිය :- ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පවතින මැණික් තැම්පතු ජාතික ආර්ථිකයට දායක කිරීම මෙන්ම 1:50,000 පරිමාණයෙන් යුත් සිතියම් ගොනුවක් සකස් කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක වේ. එහිදී එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අදාළ මැණික් විභව සිතියම හා තාක්ෂණික වාර්තාවක් නිකුත් කරනු ලැබේ. 2021 වසරේ පැවති COVID 19 වසංගත තත්ත්වය හමුවේ සංචරණ සීමා පනවා තිබීම හේතුවෙන් සම්පූර්ණ කිරීමට නොහැකිවූ නියාගම හා කිරිඇල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකෙහි ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු සිදුකරමින් විද්‍යාගාර විශ්ලේෂණය සඳහා අවශ්‍ය පස් සාම්පල ලබා ගන්නා ලදී. එම පස් නියැදි විද්‍යාගාර තුල අධ්‍යනයෙන් ලද ප්‍රතිඵල මෙන්ම භූරූපීය හා භූ විද්‍යාත්මක දත්ත අධ්‍යනයෙන් ලබා ගන්නා ලද තොරතුරු අනුව මැණික් විභවතාවයන් සහිත ප්‍රදේශ හඳුනාගන්නා ලදී.

6.1.1 නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

මෙම කොට්ඨාසය තුළ නියාගම දකුණ, හොරන්ගල්ල හා තල්ගස්වල ප්‍රදේශ ආශ්‍රිතව මැණික් අධිවිභවතා කලාප හඳුනාගෙන ඇත.මෙම ප්‍රදේශ තුල වෛරෝඩි, පසිංගල් නැමැති මැණික් විශේෂ බහුලව හමුවේ.




(අ) (ආ) (ඇ)

රූපය 01 – (අ) සහ (ආ) - මැණික් ඉල්ලම් ස්ථරය පිහිටන ආකාරය
(ඇ) පසිංගල් (alexandrite) සහ කනක (chrysoberyl) මැණික් අංශු අන්වීක්ෂීය නිරීක්ෂණය

2022 අවසන් කාර්තුව තුළ මූල්‍යමය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල සැලසුම් කරන ලද ක්ෂේත්‍ර ගවේෂණ අවසන් කිරීමට නොහැකි විය. මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ පළමු කාර්තුව තුලදී අවසන් කිරීමට අපේක්ෂිතය.

6.1.2 කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

මෙම කොට්ඨාශය කුළ ක්ෂේත්‍ර ගවේෂණ 70%ක් පමණ අවසන් කර ඇත. එහිදි එපිටවල, යටිපහුව, ඇල්ලගාව, තන්තිරියාවත්ත, ගලතුර, මඩබද්දර, මුදුන්කොටුව, දොඩම්පේ, නැදුන්වෙහෙර යන ප්‍රදේශ ආශ්‍රිතව මැණික් අධිවිභවතා කලාප හඳුනාගෙන ඇත. කළුගඟ ආශ්‍රිතව දියළු මැණික් නිධි හා රත්‍ර නිධි පිහිටන අතර කුරු ගඟ ආශ්‍රිතව ද දියළු මැණික් නිධි පිහිටා ඇත. මෙම ප්‍රදේශ ආශ්‍රිතව හමුවන මැණික් වර්ග අතුරින් නිල් හා සුදු කුරුවින්ද, ගෙවුඩ, සියළු වර්ගවල කිරිංවි, ජාගුන්, රබහ, නිල් ඇපටයිට් ප්‍රමුඛය. සමස්තයක් ලෙස ගත් කළ මෙම ප්‍රදේශයේ මැණික් ඉල්ලම අඩි 10 – 20 යන පරාසයේ ගැඹුරකින් පිහිටන අතර මෙය අධික මැණික් විභවයක් දරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකි.



(අ) (ආ)

රූපය 02 – (අ) නිල් කුරුවින්ද (blue sapphire)
(ආ) කහ කුරුවින්ද (yellow sappphire) හා රෝස කිරිංචි (pink spinel)මැණික් අංශු
අන්වීක්ෂීය නිරීක්ෂණය

2022 අවසන් කාර්තුව තුළ මූලාමය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල සැලසුම් කරන ලද ක්ෂේත්‍ර ගවේෂණ අවසන් කිරීමට නොහැකි විය. මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ පළමු කාර්තුව තුලදී අවසන් කිරීමට අපේක්ෂා කරයි.

6.1.2.1 අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල මූලික ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු අරඹමින් අදාල ප්‍රාදේශීය බලධාරීන් දැනවත් කිරීම සිදුකරන ලදි. මූලික ගවේශන අතරතුර සිදුකරමින් පවතින පතල් ආශ්‍රිතව හා ගංහා ආශ්‍රිතව සාම්පල රැස්කිරීම සිදුකරන ලදි. අයවැය හිඟය හේතුවෙන් මෙම ව්‍යාපෘති කටයුතු ඉදිරි වසර සඳහා කල් දැමීමට සිදු විය.



රූපය 03 -අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් ගවේශන කටයුතු

6.1.2.2 පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය


අධි විභවතාවයක් සහිත ප්‍රදේශ වල මැණික් කැණීම ප්‍රවර්ධනය සඳහා වැඩමුළුවක් පැවැත්විය.



රූපය 04 - දැනුවත් කිරීමේ වැඩමුළුව

6.3 ව්‍යාපෘතිය :- මැණික් ගල් තක්සේරු කිරීම සඳහා මූලික පදනමක් සකස් කිරීම

මෙම ව්‍යාපෘතියට අනුව මැණික් ගල් තක්සේරු කිරීම සඳහා පරිගනක යෙදුමක් සකස් කර මෙම ව්‍යාපෘතිය අවසන් කර ඇත.




රූ

පය 06 - යෙදුමෙහි අතුරු මුහුණත

6.4 ව්‍යාපෘතිය :- මැණික් පතල් භූමි ප්‍රතිස්ථාපනය සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ

මැණික් පතල් භූමි ප්‍රතිස්ථාපනය සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ ඇතුළත් වාර්තාව අවසන් කර ඇත. එය තාක්ෂණික විවරණයක් සඳහා මොරටුව විශ්ව විද්‍යාලය හා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත යොමු කර ඇත.




රූපය 07 - මැණික් පතල් භූමි ප්‍රතිස්ථාපනය සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ ඇතුළත් වාර්තාව

6.5 ව්‍යාපෘතිය :- මැණික් සඳහා අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම


6.5.1 ලක්මිණි වායු උදුන මඟින් තික් සිල්කි ගෙවුඩ වල වර්ණය හා පැහැදිලිබව වැඩිකිරීම පිළිබඳ අධ්‍යනය

තික් සිල්කි සාම්පල් කොටස් තුනකට වෙන් කරන ලද අතර ED-XRF, ETIR , Raman සහ UV-Visible තාක්ෂණයන් මඟින් රසායනික විශ්ලේෂණ සඳහා එක් එක් සාම්පලයෙහි පැතලි මුහුණත් සාදන ලදි.


මූලික රසායනික විශ්ලේෂණයෙන් පසුව එම සාම්පල් ඔක්සිහාරක, ඔක්සිකාරක සහ මද ඔක්සිකාරක තත්වයන් යටතේ ලක්මිණි උඳුන මඟින් තාපකරණය සිදුකරන ලදි. මෙහිදී මද_ඔක්සිකාරක තත්ව යටතේ තාපකරණය මඟින් හොඳම පැහැදිලි බව හා වර්ණය ලබාගත හැකි විය.
FTIR ප්‍රතිඵල විශ්ලේෂණය මඟින් තාප පිරියම් කරණය සිදු කරන ලද සාම්පල වෙන්කර ගත හැකි බව තහවුරු විය. Raman වර්ණාවලිය මඟින් කුරුවින්ද සඳහා ආවේනික 378, 418, 578, හා 751 යන ශිර්ෂ ලක්ෂයන් නිරීක්ෂණය විය. UV- Visible දත්ත විශ්ලේෂණය මඟින් නිල් වර්ණය සඳහා $(Fe, Ti)^{+6}$ සංකීර්ණයෙහි අන්තර් අයන ආරෝපණ හුවමාරුව බලපාන බව තහවුරු විය. ED- XRF මඟින් තාප පිරියම්කරණය මඟින් විශේෂ රසායනික වෙනසක් සිදුවී ඇති බවට සාධක හමු නොවීය.



රූපය 08 - ඔක්සිහාරක තත්ව යටතේ තාප කරණයෙන් ලද ප්‍රතිඵල




රූපය 09 - ඔක්සිකාරක තත්ව යටතේ තාප කරණයෙන් ලද ප්‍රතිඵල



රූපය 10 - මද ඔක්සිකාරක තත්ව යටතේ තාප කරණයෙන් ලද ප්‍රතිඵල

6.5.2 විදුලි උඳුන මඟින් තික් සිලිකි ගෙවුඩ වල වර්ණය හා පැහැදිලි බව වැඩිකර ගැනීම පිළිබඳ අධ්‍යනය

තික් සිල්කි සාම්පල රසායනික විශ්ලේෂණය සඳහා කපා ඔප දමන ලද මුහුණතක් සකස් කරන ලද අතර තාප පිරියම්කරණයට පෙර හා පසුව ED- XRF, FTIR, Raman හා UV- Visible තාක්ෂණයන් මඟින් විශ්ලේෂණය සිදු කරන ලදි.
සාම්පල කොටස් තුනකට වෙන් කර විදුලි උඳුන මඟින් 1700^0C ක පමණ උෂ්ණත්වයක් යටතේ පැය 24ක් පමණ රික්ත නල තත්වය යටතේ, සාමාන්‍ය නල තත්වය යටතේ සහ නලය තුල නයිට්‍රජන් වායුව පුරවා තාප පිරියම් පර්යේෂණ සිදුකරන ලදි. මෙහිදී ප්‍රශස්ත වර්ණ වැඩිවීම රික්ත නල තත්වය යටතේ පිරියම්කරණය මඟින් ලබාගත හැකි විය.



රූපය 11 – තික් සිල්කි විදුලි උඳුන මඟින් තාප කරණයට පෙර හා පසු

6.5.3 විදුලි උඳුන මඟින් පුෂ්පරාග පිරියම් කරණය සඳහා නව ක්‍රමවේදයක් හඳුනා ගැනීම

පුෂ්පරාග සාම්පල රසායනික විශ්ලේෂණය සඳහා කපා ඔපදැමූ මුහුණතක් සාදන ලද අතර තාපකරණය පෙර හා පසු ED- XRF, FTIR ,Raman හා UV- Visible තාක්ෂණයන් මඟින් විශ්ලේෂණය කරන ලදි. සාම්පල කොටස් දෙකකට වෙන් කර 1700^0C ක පමණ උෂ්ණත්වක් යටතේ පැය විසිහතරක පමණ කාලයක් සඳහා දිගින් දිගටම නලය තුලට ඔක්සිජන් වායුව සපයමින්ද, ආරම්භයේදී පමණක් නලය තුලට ඔක්සිජන් වායුව පිරවීම යන ආකාර දෙකට තාපකරණ පර්යේෂණ සිදුකරන ලදි. මෙහිදී ප්‍රශස්ත වර්ණ වැඩිවීම දිගින් දිගටම ඔක්සිජන් වායුව නලය තුලට ලබාදෙමින් පිරියම්කරණයේදී ලබා ගත හැකි විය.



රූපය 12 - පිරියම් කරණයට ප්‍රථම



රූපය 13 - වායු උඳුන මඟින් පිරියම් කරණ ප්‍රතිඵල



රූපය 14 - විදුලි උඳුන මඟින් ලද ප්‍රතිඵල

6.5.4 ටැන්සනයිට් විදුලි උඳුන මඟින් තාප පිරියම් කරණය සඳහා ප්‍රශස්ත තත්ව හඳුනා ගැනීම.

ටැන්සනයිට් සාම්පල සඳහාද රසායනික විශ්ලේෂණය සඳහා මුහුණතක් සකස් කර තාපකරණයට පෙර හා පසු ED- XRF, FTIR ,Raman හා UV- Visible යන තාක්ෂණික ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය සිදුකරන ලදි. විදුලි උඳුන මඟින් ටැන්සනයිට් තාපකරණය සඳහා ප්‍රසස්ථ තත්වයන් ලෙස 1550^0C උෂ්ණත්වයක් යටතේ රික්ත නල තත්වය තුල පිරියම් කිරීම හඳුනා ගැනුණි.




රූපය 15 - තාපකරණයට පෙර


රූපය 16 - තාප කරණයට පසු

6.5.5 ලක්මිණි වායු උඳුණ මඟින් රත්‍ර ගෙවුඩ තාපකරණය සඳහා නව ක්‍රම වේදයක් හඳුනා ගැනීම

රත්‍ර ගෙවුඩ සාම්පල මිලදී ගැනීමෙන් අනතුරුව පිරිසිදු කර කපා ඔපදැමූ මුහුණත් සාදා ED- XRF, FTIR ,Raman හා UV- Visible මඟින් තාප කරණයට පෙර හා පසු විශ්ලේෂණයක් සිදුකරන ලදි. ලක්මිණි වායු උඳුන මඟින් තාප කරණ ප්‍රශස්ථ තත්ව ලෙස 1550^0C ක පමණ උෂ්ණත්වක් යටතේ ඔක්සිකාරක කුටීර වායුගෝලීය තත්වය යටතේ පිරියම් කර ඉක්මන් සිසිලනයකට ලක්කිරීම හඳුනා ගත හැකි විය.



රූපය 17 - ඉක්මන් සිසිලන ක්‍රියාවලිය



රූපය 18 - තාප කරණය කරන ලද රත්‍ර ගෙවුඩ

6.6 ව්‍යාපෘතිය :- ශ්‍රී ලංකාවේ ස්වර්ණාභරණ නිෂ්පාදන ශිල්පීන් ශරීරගත රසදිය ප්‍රමාණය පිළිබඳ ජෛව රසායනික අධ්‍යනයක් සිදු කිරීම.

මෙහිදී බස්නාහිර පළාත තුල තෝරාගත් ස්වර්ණාභරණ නිෂ්පාදන ශිල්පීන් 84 දෙනෙකු ගේ මුත්‍රා සාම්පල වල රසදිය ප්‍රමාණය නිර්මාණය කිරීම සිදු කරන ලදී. එහිදී ස්වර්ණාභරණ නිෂ්පාදනයෙන් ඉවත්වන කැලිකසල භාවිතයෙන් රත්‍රන් නිස්සාරණ කරනු ලබන පුද්ගලයින් ගේ රසදිය ශරීර ගතවීම ඉහළ අගයක පවතින බව හඳුනාගන්නා ලදී.



රූපය 19 - SSJS වෙතින් මුත්‍රා සාම්පල එකතු කිරීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම

මේ අනුව එම පුද්ගලයින් දැනුවත් කිරීම හා රසදිය වෙනුවට ආදේශක භාවිතය පිළිබඳ දැනුවත් කිරීම සිදු කල යුතුව ඇත. එමෙන්ම තව දුරටත් අධ්‍යයනය කටයුතු වෛද්‍ය විද්‍යානුකූලව සිදු කල යුතුව ඇති අතර වෛද්‍ය උපදෙස් සඳහා යොමු කල යුතුව ඇත.

6.7 ව්‍යාපෘතිය :- රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම.

ISO 17025:2017 විද්‍යාගාර ප්‍රතිනතය යටතේ ආයතනික විද්‍යාගාර ප්‍රතිනතය ආරම්භ කර ඇත. මෙහිදී කාර්මික තාක්ෂණික ආයතනයේ උපදේශකත්වය යටතේ අදාල කටයුතු කරමින් පවතී. රසායනාගාර තත්ත්ව කළමනාකරණය පිළිබඳ සම්පූර්ණ ක්‍රියාවලිය 2023 දී අවසන් කෙරේ.

6.8 ව්‍යාපෘතිය :- වැඩමුළු

රූබි හා සෆයා තාපකරණය පිළිබඳ නව තාක්ෂණික දැනුම ලබා දීම සඳහා රත්නපුර මධ්‍යස්ථානයේ දී 66 දෙනෙකු පමණ සහභාගීත්වයෙන් වැඩමුළුවක් පැවැත්වීය.




රූපය 20 - තාක්ෂණික වැඩමුළුව

6.9 ව්‍යාපෘතිය :- ප්‍රකාශන එළි දැක්වීම

Publication of the manuscript in SCI Journals

6.9.1 C. P. Udawatte, **S. Illangasinghe***, S. M. S. Abeyaweera, L. R. K. Perera, C. Weerasooriya, C. Sutthirat, **N. Jayasinghe**, T. Dharmaratne and S. Diyabalanage. Spectroscopical and Chemical Properties of Cobalt Diffused Blue Topaz, Sri Lanka. Accepted in the Journal of Metals, Materials and Minerals.

*Corresponding Author



රූපය 21- සහරාව මගින් පිළිගැනීමේ දැනුම්දීම

6.9.2 Jayasinghe, R.M.N.P.K. and Pitawala, H.M.T.G.A. 2022. Geomorphological and drainage morphometrical relationship of gem potential alluvial deposits in upper Kalu Ganga basin, Sri Lanka: A remote sensing and GIS based approach. Journal of Geological Society of Sri Lanka, 22 (2), pp. 15-26.

6.9.3 Rifkhan, M.N.M., Wewegedara W.G.C.N., Jayasinghe R.M.N.P.K., Dharmaratne T.S., Malaviarachchi M.A.S.P.K, Chndrajith Rohana. 2022. Reddish-Brown Zircons of Sri Lanka; A Detailed Study and Development of a New Technique for Yellow to Golden Yellow Colour Enhancement. Journal of Geological Society of Sri Lanka, 22 (2), pp. 39-45.

6.10 ග්‍රන්ථ ප්‍රකාශයට පත් කිරීම.

6.10.1 ශ්‍රී ලාංකේය මැණික් පතල් කර්මාන්තය තිරසර යුගයක් කරා නම් වූ ග්‍රන්ථයෙහි ඉංග්‍රීසි පරිවර්ථනය වූ "Sri Lankan Gem Mining Industry for Sustainable Era" නම් වූ ග්‍රන්ථය සම්පාදනය කිරීම. මෙය 2022 වර්ෂයේ අවසන් කාර්තුව තුළ මුද්‍රණය කිරීමට සැලසුම් කර තිබුණද මූල්‍යමය ප්‍රතිපාදන හිහතාවය මත 2023 වර්ෂයේදී මුද්‍රණය කිරීමට සැලසුම් කර ඇත.



රූපය 22-"Sri Lankan Gem Mining Industry for Sustainable Era" ග්‍රන්ථය

6.11 <u>ව්‍යාපෘතිය :- තාක්ෂණික සේවා ලබා දීම</u>

6.11.1 පුද්ගලික ඉඩම් වල මැණික් නිධි ගවේෂණය

අවිස්සාවේල්ල ප්‍රදේශයේ තල්දුව ග්‍රාමයේ පුද්ගලික ඉඩමක මැණික් නිධි ගවේශනය සිදු කරන ලදි.



රූපය 05 - ගවේශන කටයුතු

6.11.2 තාප පිරියම්කරණ සේවා

මුදල් අයකර සිදුකරනු ලබන බාහිර පුද්ගලයන් සඳහා ගෙවුඩ තාප කරණ සේවා ලබාදීම යටතේ ලක්මිණි උඳුන මඟින් සේවා 13ක් හා විදුලි උඳුන මඟින් සේවා 08ක් සපයා මෙම වර්ෂය තුල රු.246,000ක ආදායමක් උපයා ඇත.

6.11.3 අධිතාක්ෂණික රසායනාගාර සේවා

රසායනාගාර විශ්ලේෂණ සේවා ලබාදීම යටතේ ED-XRF විශ්ලේෂණ සාම්පල 42ක් හා Raman විශ්ලේෂණ සාම්පල 14ක් මඟින් 2022 වර්ෂය තුලදී රු.351,900 ක මුදලක් ආයතනය විසින් උපයා ඇත.



පරිපාලන හා මානව සම්පත් අංශය

බාහිර පුහුණු වැඩසටහන් සඳහා සේවක සහභාගීත්වය - 2022
දේශීය පුහුණු වැඩසටහන්

#	පුහුණු මධ්‍යස්ථාන	පුහුණු වැඩසටහනේ නම	සහභාගිවූවන්
1.	නිපුණතා සංවර්ධන අරමුදල (SDFL)	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙදින වැඩමුළුව	1. ලස්නි සුරේන්ද්‍ර මිය (සහකාර අධ්‍යක්ෂ - ස්වර්ණාභරණ) 2. සුභාෂිණී කෝණාර මිය (පුහුණු නිළධාරී) 3. අශෝක රාජරත්න මයා (කළමනාකරණ සහකාර) 4. එච්.එම්.එන්.එන්.කේ විජේරත්න මෙය (විගණන සහකාර)
2.	නිපුණතා සංවර්ධන අරමුදල (SDFL)	ප්‍රවාහන කළමණාකරණය පිළිබඳ දෙදින වැඩමුළුව	1. කල්පනී පෙරේරා මිය (කළමනාකරණ සහකාර)


DEBT
Savings
Reduction
Bills
69.928
63.772
44.870
48.991
20.556
31.012
26.417
11.311
12.002

මූල්‍ය අංශය

විගණනය කරන ලද පසුගිය අවුරුදු 05 සඳහා වූ මූල්‍ය තොරතුරු

(රු.000)

	2018	2019	2020	2021	2022
මෙහෙයුම් ආදායම්					
භාණ්ඩාගාර ප්‍රධාන පුනරාවර්තන	79,854.0	85,000.00	77,973.00	77,060.00	86,996.00
වෙනත් දායක විමි	37,104.7	35,622.80	29,536.91	22,528.16	19,430.60
පාඨමාලා ගාස්තු	10,835.1	12,212.03	12,409.64	3,542.50	15,529.05
සේවා ගාස්තු ආදායම්	76.5	308.0	72.5	12.00	246.00
භූ විද්‍යා පර්යේෂණ සේවාවන්ගෙන් ලැබීම්					
මුළු මෙහෙයුම් ආදායම්	**127,870.3**	**133,142.83**	**119,992.05**	**103,142.66**	**122,201.65**
වෙනත් ආදායම්	2,114.2	1,690.02	1,042.83	837.49	1,742.04
පොලි ආදායම	519.4	553.42	457.21	293.71	466.03
වෙනත් ලැබීම්	25.59	60.48	4680.0	1564.0	
මුළු ආදායම	**130,529.49**	**135,446.75**	**126,172.10**	**105,837.39**	**124,409.73**
අඩුකලා - වියඳම්					
ඒ සේවක හා පරිපාලන වියදම්	88,935.0	98,994.18	91,624.36	84,691.33	99,431.65
බී ඎය සහ පොදු වියඳම්	38,806.7	41,564.02	28,208.10	33,251.66	30,297.86
මුළු වියදම්	**127,741.78**	**140,558.20**	**119,832.46**	**117,943.00**	**129,729.51**
අතිරික්තය (ඌණතාවය)	**2,787.6**	**(5,111.45)**	**6,339.64**	**(12,105.1)**	**(5,319.78)**

2022 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය

විස්තරය	2022		2021	
	re'000	re'000	re'000	re'000
මෙහෙයුම් ආදායම්				
පුනරාවර්තන ප්‍රදාන -භාණ්ඩාගාර		86,996.00		77,060.00
වෙනත් ආදායම්				
පාඩමාලා ගාස්තු		15,529.05		3,542.50
ගෙවුඩ තාපකරණ ගාස්තු		246.0		12.0
පොළී ආදායම්		466.03		293.71
විවිධ ආදායම්		1,742.04		837.50
13 වසරක අබන්ඩ අධ්‍යාපන වැඩසටහන				1,564.00
මෙහෙයුම් ආදායම් එකතුව		**104,979.13**		**83,309.71**
අඩු කළා : මෙහෙයුම් වියදම්				
කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා		57,278.25		51,666.29
ගමන් වියදම්		72.60		53.11
සැපයුම් හා පාරිභෝජන දව්‍ය		5,016.90		2,800.79
නඩත්තු වියදම්		4,568.33		2,062.29
ගිවිසුම් ගත සේවා		28,282.47		25,743.55
පුහුණු වියදම්		3,413.72		1,908.07
වෙනත් මෙහෙයුම් වියදම්		774.80		443.61
මෙහෙයුම් වියදම් එකතුව		**99,407.07**		**84,677.71**
මෙහෙයුම් වලින් ලද අතිරික්තය/ (ඌනතාවය)		**5,572.06**		**(1,368.0)**
අඩු කළා - මූල්‍ය පිරිවැය		(24.57)		(13.62)
ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන	16,876.10		17,917.47	
වෙනත් ලැබීම්				
	16,876.10		17,917.47	
අඩු කළා - ක්ෂය කපා හැරීමේ වියදම්	(27,743.37)	(10,867.27)	(28,640.97)	(10,723.50)
වෙනත් ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිපාදන	(2554.50)		4610.61	
අඩු කළා - ප්‍රාග්ධන ආයෝජන වියදම්	(2554.50)		(3935.71)	
ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය කිරීම්	-		(674.90)	
වෙනත් ප්‍රාග්ධන ආයෝජන වල ශුද්ධ වියදම		(5319.78		(12,105.12)
මෙහෙයුම් නොවන ආදායම්				
එකතු කළා වත්කම් විකිණීමෙන් ලද ආදායම				
අති විශේෂ අයිතමයන්ට පෙර අතිරික්තය/(ඌනතාවය)		(5319.78)		(12,105.12)
අති විශේෂ අයිතම				
කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය / ඌනතාවය		(5319.77)		(12,105.12)
එකතු කළා පෙර වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(ඌනතාවය)	(39,308.94)		(31,479.11)	
අඩු කළා - පෙර වර්ෂ ගැලපීම්		(2930.13)		4275.30
ශුද්ධ අතිරික්තය /(ඌනතාවය)		**(47,558.85)**		**(39,308.93)**

මැණික් හා ස්වර්ණාභරන පර්යේෂණ හා අභ්‍යාස ආයතනය
2022 දෙසැම්බර් **31** දිනට ශේෂ පත්‍රය

විස්තරය	2022 රු.000	2022 රු.000	2021 රු.000	2021 රු.000
ජංගම නොවන වත්කම්				
දේපල යන්ත්‍ර උපකරණ	101,259		129,378	
පාරිනෝෂික අරමුදල	955	102,214	2272	131,650
ස්ථාවර තැන්පතු ගිණුම්		4304		3980
ජංගම වත්කම්				
තොග හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	4798		3798	
විකිණීම සඳහා ඇති පොත්				
ණය හා අත්තිකාරම්	3362		1847	
තැන්පතු	630		610	
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම්	7483		8429	
දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘතිය	1559		3577	
පෙර ගෙවීම්	202		125	
මුදල් හා බැංකු	9114	27,148	8793	27,179
වත්කම් එකතුව		133,666		162,809
වගකීම්				
ජංගම වගකීම්				
ගෙවිය යුතු ගිණුම්	604		599	
උපචිත වියදම්	4336	4,940	6727	7,326
ජංගම නොවන වගකීම්				
Minimata ව්‍යාපෘතිය	179		570	
පරිනෝෂික සඳහා වෙන්කිරීම්	13350		14172	
ජාතික විද්‍යා පදනම		13,529		14,742
වගකීම් එකතුව		18,469		22,068
ශුද්ධ වත්කම් එකතුව		**115,197**		**140,741**
ශුද්ධ වත්කම් / ස්කන්ධ				
සහභාගිත්ව ප්‍රාග්ධනය	50000		50000	
සංචිත -මැණික්	43772		43772	
වෙනත් දායක විමි	850		850	
සේවක වක්‍රිය අරමුදල	1857		1721	
විලම්භිත ආදායම් - ප්‍රාග්ධන ප්‍රතිපාදන	66276		83706	
සමුච්චිත අරමුදල	(47,558)		(39,308)	
ශුද්ධ වත්කම් ස්කන්ධ එකතුව		**115,197**		**140,741**

.....
සභකාර අධ්‍යක්ෂ (මූල්‍ය)

09-05-2023
දිනය:

.....
සභාපති

දිනය : 09-05-2023

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

දිනය: 09-05-2023

මැණික් හා ස්වර්ණාභරණ පරීක්ෂණ හා අභ්‍යාස ආයතනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය (රු.000)

විස්තරය	2022	2021
මෙහෙයුම් කාර්යන්ගේ මුදල් ප්‍රවාහය		
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්ත/ඌනතාව	(5,319.78)	(12,105.12)
මුදල් නොවන ගනුදෙනු		
ක්ෂය වෙන්කිරීම	27,743.37	28,640.97
පොළි	(466.03)	(293.71)
විලම්බිත ප්‍රාග්ධන ආදායම් ගැලපීම්	(19,430.61)	(22,528.16)
අනෙකුත් ජංගම වගකීම් වල වැඩි වීම / අඩුවීම	(2,126.89)	610.55
දේපල යන්තු හා උපකරණවිකිණීම මත ලාභ	(13.66)	
කල්බදු කුලි	473.48	473.48
පාරිතෝෂික වෙන්කිරීම්	2,939.77	479.25
ස්ථාවර වත්කම් ගැලපීම	(8.82)	(41,660.52)
පාරිතෝෂික ගෙවීම්	(3,761.43)	(2,134.27)
අනෙකුත් ජංගම වත්කම් වල වැඩි වීම	(1,331.63)	2,866.50
ගෙවිය යුත පාරිතෝෂික		
සංචිත		41,660.52
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (අ)	**(1,302.23)**	**(3,990.53)**
ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය		
යන්තු හා උපකරණ මිලදී ගැනීම	(89.65)	(3,136.4)
පාරිතෝෂික අරමුදලේ වැඩිවීම	1,316.79	(1,000.7)
පොළි ආදායම	602.45	450.37
ස්ථාවර තැන්පතු වැඩි වීම / අඩුවීම	(324.42)	1,932.2
දේපල යන්තු හා උපකරණවිකිණීම් මත ලාභ	13.66	
ආපදා ණය ගෙවීම්	(2,743.05)	(1,364.44)
ආපදා ණය ලැබීම්	1,238.72	1,827.31
ආයෝජන කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහය (ආ)	**14.51**	**(1,291.57)**
<u>මූල්‍ය කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය</u>		
ප්‍රාග්ධන ප්‍රදාන	2,000.0	5,024.0
Minimata ව්‍යාපෘතිය	(391.82)	300.4
ජාතික විද්‍යා පදනමෙහි අරමුදල		(1,310.4)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)	**1,608.18**	**4,013.95**
මුදල් හා මුල්‍ය අයිතමයන්ගේ ශුද්ධ වැඩිවීම/අඩුවීම (අ) (ආ) (ඇ)	320.46	(1,268.15)
ආරම්භක මුදල් /මූල්‍ය ශේෂය	8,793.22	10,061.37
වර්ෂය අවසානයේ මුදල් / මූල්‍ය ශේෂය	**9,113.68**	**8,793.22**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. IMT/G/GJRTI/FA/2022

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 ජූනි 16 දින

සභාපති,
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

-

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවමත් භාවිතයේ පවතින පිරිවැය වටිනාකම රු.53,558,228 ක් වූ වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එසේම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව මෙකී වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දේපළ පිරියත හා උපකරණ තුල ඇතුලත් රු. 2,301,575 ක් වූ මැණික් ගල් ප්‍රමාණය වසර හතරකට අධික කාලයක සිට ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඇ) බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව 2022 දෙසැම්බර් 31 දිනට ඍජුවම බැංකුවෙහි තැන්පත් කල වටිනාකම රු.1,635,470 ක් වූ අතර, මෙම ශේෂය තුල ඇතුළත්ව ඇති 2020 හා 2021 වර්ෂයන්වලදී බැංකුවට ඍජුවම තැන්පත් කර තිබූ වටිනාකම රු.319,710 ක්ද වූ අතර මෙකී ඍජු තැන්පතු මොනවද යන්න හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

03. වෙනත් කරුණු

(අ) ආයතනයේ ගිණුම් කටයුතු සඳහා 2017 වර්ෂයේදී රු. 346,035 ක් වැයකර මිලදීගත් ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය, වසර 06ක් ගතවී ඇතත් එහි පැවති අඩුපාඩු හේතුවෙන් එම පද්ධතිය භාවිතා

කර ගිණුම් කටයුතු පවත්වාගෙන ගොස් නොමැති අතර මෙම මෘදුකාංගය භාවිතා කිරීමේදී සිදුකල යුතු යාවත්කාලීන කිරීම් හා නඩත්තු කිරීම් සම්බන්ධව සේවා ගිවිසුමක් ද නොතිබුණි.

(ආ) ආයතනයේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය ඉදි කිරීම සඳහා 2016 වර්ෂයේදී රු.14,204,402 ක් වැය කර 30 අවුරුදු බදු පදනම මත ලබාගත් ඉඩමෙහි, ප්‍රවර්තන වර්ෂය තෙක් අදාල කාර්යන් සිදු නොවීම හේතුවෙන් වසර 06 කට අධික කාලයක සිට එම ඉඩම ඌණ උපයෝජිතව පැවතුණි.

(ඇ) වැඩිපුර ගෙවූ වැටුප් ශේෂය තුල, නිලධාරීන් 04 දෙනකුගෙන් වාරික වශයෙන් අයකරගත යුතු නමුත් එලෙස අය නොවන එකතුව රු.466,762 ක් වූ මුදලක් අන්තර්ගතව පැවතුණි.

(ඈ) ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 136ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 65ක් වූ අතර තනතුරු 71ක් එනම් අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 52 ක් පුරප්පාඩුව තිබුණි. මෙම පුරප්පාඩු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන අධ්‍යක්ෂක ජනරාල් තනතුර, අධ්‍යක්ෂක(පර්යේෂණ) තනතුර පුරප්පාඩුව පවතී. තවද, පර්යේෂණ කාර්යන් සඳහා අනුමත තනතුරු 29 න් 24 ක් හා පුහුණු කාර්යන් සඳහා අනුමත 33 න් 19 ක් පුරප්පාඩුව පැවතීම, පර්යේෂණ හා පුහුණු කටයුතු සිදු කිරීම කෙරෙහි අහිතකර අකාරයෙන් බලපා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති